ET/SSS/2022(2023)/OL/50/S/Q/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Drama & Theatre

# නාට්‍ය හා රංග කලාව



Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa

The National e-learning Portal for The General Education

මෙහෙයවීම : දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | අන්තර්ගතය : සෞන්දර්යය අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

50 | S | I, II

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series**

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியவும் I, II
**Drama & Theatre I, II**

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

**සැලකිය යුතුයි:**
* සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
* ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.

- **පහත දැක්වෙන පද්‍ය පාඨ ඇසුරින් අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) අත්තක පිපි මලක් ලෙසේ - පෙත්තක ඇඳි ඉරක් ලෙසේ
සත්තක මගෙ පුතුගෙ යසේ - නෙත් දෙක හැර බලන් මෙසේ

(B) මව් පියො නිදහස් වෙන්නටා - මාව දුන්නයි නාකිවූ හමෙකුටා
උන්දැල හට කඹුරන්නටා - යැද ඉන්න සුරන් හට දෙස් කොටා

(C) උත්තම වන් ලොව පතලා - එංගලන්ත නමින් යුතු විපුලා
තුංග සිරින් රැන්දු සකලා - දේශ ලන්ඩන් පුරවර නිමලා

(D) ලප නොමවන් සඳ සේ සොමි ගුණෙනා....
ආදර දිනනා සිසු සැවොමා....

(E) මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ....
අපේ උද්‍යාන ප්‍රීති සැපා වේ....

01. නව නාට්‍ය නිර්මාණයකට අයත් වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) D ය.

02. ශාන්තිකර්මයක දී මෙන් ම ගැමි නාටකයකට ද අයත් වන්නේ,
1) A ය. 2) C ය. 3) D ය. 4) E ය.

03. නූර්ති නාට්‍ය සම්ප්‍රදායට අයත් වන්නේ,
1) B ය. 2) C ය. 3) D ය. 4) E ය.

04. නාඩගම් ගැමි නාට්‍ය සම්ප්‍රදායට අයත් වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) E ය.

05. කෝලම් ගැමි නාට්‍ය සම්ප්‍රදායට අයත් වන්නේ,
1) A ය. 2) B ය. 3) C ය. 4) E ය.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

06. පසුතල නිර්මාණය පිළිබඳ පිළිගත **නොහැකි** ප්‍රකාශයක් වන්නේ,
1) ප්‍රක්ෂේපණ යන්ත්‍ර යොදා ගෙන පසුතල මැවීම සිදුකළ හැකි ය.
2) නාට්‍යධර්මී නාට්‍යයේ දී පසුතල නිර්මාණයන් වාචිකව යොදා ගත හැකි ය.
3) නළු නිළියන් යොදා ගෙන පසුතල නිර්මාණය කරන අවස්ථා දැකිය නොහැකි ය.
4) පසුතල නිර්මාණයේ දී නාට්‍යයේ ශෛලිය පිළිබඳව ගැඹුරින් සොයාබැලීමක් සිදු වේ.

07. කෙටි නාට්‍යයක් නිර්මාණය කිරීමේ දී වඩාත් ම සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
1) ගැඹුරු හා අපූරු සංක්ෂිප්ත ස්වභාවය
2) රංග අවකාශය විසිරුණු ස්වභාවයක් ගැනීම
3) අවස්ථා කිහිපයක් තුළ දිගහැරෙන කතාවක් විය යුතු වීම
4) චරිත 10ත් 15ත් අතර යොදා ගැනීම සාමාන්‍ය ලක්ෂණයක් වීම

08. දික්තල කාලගෝල නාට්‍යයේ භාවිත වන ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,
1) උඩැක්කිය 2) මද්දලය 3) සෝෂක බෙරය 4) ඩොලැක්කිය

09. නිර්මාණාත්මක රංග ක්‍රීඩාවලින් අපේක්ෂිත අරමුණක් නොවන්නේ,
1) ළයෙහි ධාරිතාව වැඩි කර ගැනීම
2) ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව වර්ධනය කිරීම
3) සාමූහික බව වර්ධනය කිරීම
4) අවධානය පවත්වා ගැනීම

10. ප්‍රොසීනියම් වේදිකාවේ භාවිත වන තිර වර්ගයකි.
1) තීරු පටි තිරය 2) බිම් තිරය 3) වියන් තිරය 4) අහස් තිරය

11. නූර්ති නාට්‍යය සඳහා යොදා ගන්නා සංගීතය වන්නේ,
1) දක්ෂිණ භාරතීය සංගීතය යි.
2) කපිරිඤ්ඤා සංගීතය යි.
3) කන්තාරු සංගීතය යි.
4) උත්තර භාරතීය සංගීතය යි.

12. නාට්‍ය උපකරණ භාවිතය පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
1) නාට්‍යය ප්‍රදර්ශනය කරන අවස්ථාවේ දී පමණක් භාවිත කරයි.
2) නාට්‍ය පුහුණුවීම්වල දී සිට ම භාවිත කරයි.
3) සැබෑ උපකරණ ම රංගනයට යොදා ගනියි.
4) සෑම නාට්‍යයකට ම නාට්‍ය උපකරණ භාවිත කළ යුතු ය.

13. කතාන්දරයක් ඇසුරින් කෙටි නාට්‍ය පිටපතක් රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
   1) තෝරා ගත් කතා පුවතේ සියලු ම සිදුවීම් පිටපතට ඇතුළත් කළ යුතු ය.
   2) ගැටුමක් මූලික වන පරිදි සිද්ධි ගැළපිය යුතු ය.
   3) කතාන්දරයේ පිළිවෙළින් ම නාට්‍ය පුවත වින්‍යාසගත කළ යුතු ය.
   4) අවස්ථා හා සිදුවීම් රැසක් ඇතුළත් වන පරිදි රචනා කළ යුතු ය.



**A**



**B**

14. ඉහත **A සහ B** ඡායාරූපවලින් දැක්වෙන්නේ,
   1) වර්ණ චක්‍රය සහ ධාරාලෝක පහන යි.
   2) වර්ණ චක්‍රය සහ යොමු පහන යි.
   3) ඩිමරය සහ ධාරාලෝක පහන යි.
   4) ක්ෂණ පහන සහ යොමු පහන යි.

15. ඉහත **A සහ B** ඡායාරූපවල කාර්යයන් පිළිබඳ නිවැරදි පිළිතුර වන්නේ,
   1) A අලෝක ධාරිතව අඩු වැඩි කිරීම සහ B සමස්ත වේදිකාව ම ආලෝකවත් කිරීම
   2) A ආලෝකය නිවි නිවී දැල්වීම සහ B එක් ස්ථානයකට පමණක් ආලෝකය යොමු කිරීම
   3) A ගගණිකාව ආලෝකවත් කිරීම සහ B එක් චරිතයක් ඉස්මතු කොට දැක්වීමයි
   4) A විවිධ වර්ණයේ අලෝකධාරාවන් ලබා ගැනීම සහ B සමස්ත වේදිකවම ආලෝකවත් කිරීම

- **පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| මුල් කෘතිය | රචකයා | අනුවර්තන/ පරිවර්තන | අනුවර්තක / පරිවර්තක |
|---|---|---|---|
| අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර් | 'A' | වෙස් මුහුණු | ධම්ම ජාගොඩ |
| ගුඩ් වුමන් ඔෆ් සෙට්ෂුවාන් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | 'B' | සුගතපාල ද සිල්වා |
| ද එල්ඩර් සන් | 'C' | පුත්‍ර සමාගම | ප්‍රසන්න විතානගේ |
| **'D'** | ගාර්ෂියා ලෝකා | මූදු පුත්තු | ගුණසේන ගලප්පත්ති |
| වේටින් ෆෝ ගොඩෝ | සැමුවෙල් බෙකට් | ගොඩෝ එනකං | 'E' |

16. ඉහත වගුවේ 'A' කොටුවට ඇතුළත් විය යුතු නම වන්නේ,
   1) ආතර් මිලර්  2) විලියම් ශේක්ස්පියර්
   3) ටෙනිසි විලියම්ස්  4) තෝර්න්ටන් වයිල්ඩර්

17. ඉහත වගුවේ 'B' කොටුවට ඇතුළත් විය යුතු කෘතිය වන්නේ,
   1) දිරිය මව සහ ඇගේ දරුවෝ  2) නම්බුකාර අබිසරු ලිය
   3) සෙට්සුවානයේ යහපත් ස්ත්‍රිය  4) හිත හොඳ අම්මණ්ඩි

18. ඉහත වගුවේ ‘C’ කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තකයාගේ නම වන්නේ,
    1) විලියම් ශේක්ස්පියර් 2) සොෆොක්ලීස්
    3) ඇලෙක්සැන්ඩර් වැම්පිලෙව් 4) හෙන්රික් ඉබ්සන්

19. ඉහත වගුවේ ‘E’ කොටුවට ඇතුළත් විය යුතු නම වන්නේ,
    1) ජේ. ඒ. සෙල්වදොරේ 2) සිරි එදිරිවීර
    3) ආරියවංශ රණවීර 4) පියදාස නිශ්ශංක

20. ඉහත වගුවේ ‘D’ කොටුවට ඇතුළත් විය යුතු නම වන්නේ,
    1) කැට් ඔන් අ හොට් ටින් රූෆ් 2) යෙර්මා
    3) ද සීගල් 4) ද බ්ලඩ් වෙඩින්

- **පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| **(A)** | **(B)** | **(C)** | **(D)** | **(E)** |

21. ඉහත ඡායාරූප අතුරින් අහස් මාලිගා, මනරංජන වැඩ වර්ජන නාට්‍යවල රංගනයෙන් දායක වූ ශිල්පියා/ශිල්පිනිය වන්නේ,
    1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘C’ ය. 4) ‘D’ ය.

22. රෝමය ගිනි ගනී නාට්‍යය වෙනුවෙන් හොඳම නළුවාට හිමි සම්මානය දිනා ගන්නා ලද ශිල්පියා වන්නේ,
    1) ‘B’ ය. 2) ‘C’ ය. 3) ‘D’ ය. 4) ‘E’ ය.


23. 70 දශකයේ රංගනයට පිවිස මනමේ, බෙරහඬ, මූදු පුත්තු නාට්‍යවල රංගනයෙන් දායක වූයේ,
    1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘C’ ය. 4) ‘D’ ය.

24. පැරණි කවි නාඩගම් ශෛලියට අනුරූපව නාට්‍යයක් නිර්මාණය කළේ,
    1) ‘A’ ය. 2) ‘B’ ය. 3) ‘C’ ය. 4) ‘D’ ය.

25. නාට්‍ය රචනය, අධ්‍යක්ෂණය, මෙන් ම නවකතා හා ශාස්ත්‍රීය ග්‍රන්ථ නිර්මාණයේ ලා ප්‍රසිද්ධියක් උසුලන්නේ,
    1) ‘B’ ය. 2) ‘C’ ය. 3) ‘D’ ය. 4) ‘E’ ය.

- **පහත දැක්වෙන වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් 26 සහ 27 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


(A)


(B)

26. ඉහත ‘A’ සහ ‘B’ වෙස් මුහුණු පිළිබඳ සත්‍ය ප්‍රකාශය වන්නේ,
   1) ‘A’ සන්නි මුහුණකිග ‘B’ කෝලම් මුහුණකි.
   2) ‘A’ සහ ‘B’ සන්නි මුහුණු දෙකකි.
   3) ‘A’ කෝලම් කි. ‘B’ සන්නි මුහුණකි.
   4) A’ සහ ‘B’ කෝලම් මුහුණු දෙකකි. .

27. ඉහත ‘A’ සහ ‘B’ වෙස් මුහුණු පිළිවෙළින් දැක්වෙන්නේ,
   1) A කණ සන්නිය හා B ජෙඩි කෝලමයි.
   2) A අණබෙර කෝලම සහ B ගොළු සන්නියයි.
   3) A ජස කෝලම සහ B බිහිරි සන්නියයි
   4) A කෝළ සන්නිය සහ B නොංචි කෝලමයි.

28. ජැක්සන් ඇන්තනී මහතා රංගනයෙන් දායක වූ නාට්‍ය නිර්මාණ ඇතුළත් වරණය වන්නේ,
   1) මධුර ජවනිකා, හුණු වටයේ කතාව, දෝන කතිරිනා
   2) මධුර ජවනිකා, මනමේ, රත්නාවලී
   3) මහ සමයම, කුවේණි, දිරිය මව සහ ඇගේ දරුවෝ
   4) මහ සමයම, මෙතනින් මාරු වෙනු, මරාසාද්

29. සොකරි නාට්‍යයෙන් ඉදිරිපත් කරන අනුකරණ අවස්ථා වන්නේ,
   1) නැව තැනීම, නැව දියත් කිරීම
   2) කුරහන් කැපීම, කුරහන් කෙටීම
   3) රොද්දෙන් පෙළීම, නූල් වක් කිරීම
   4) නානු ගෑම, කණ්ණාඩියෙන් බැලීම

30. අංග රචනා ශිල්පියා හා සෘජු සම්බන්ධතාවක් පවත්වන ශිල්පියෙක් වන්නේ,
   1) වේදිකා පරිපාලක ය.
   2) පෙළ මතක් කරන්නා ය.
   3) රංගාලෝක ශිල්පියා ය.
   4) සංගීත අධ්‍යක්ෂ ය.

31. නාට්‍ය ගීත ගායනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් **නොවන්නේ,**
   1) රූපණයේ යෙදෙන නළුවන් විසින් ම ගීත ගායනා කිරීම අනිවාර්‍ය වේ.
   2) නාට්‍ය ගීත වාචික අභිනයට අයත් වේ.
   3) නාට්‍යධර්මී ශෛලියේ දී ගීත ගායන බහුලව යොදා ගැනේ.
   4) වේදිකා නාට්‍යයක දී ගීත ගායනා යොදා ගැනීම අත්‍යවශ්‍ය නොවේ.

32. දික්තල කාලගෝල කතා වස්තුවේ දුබලතාවක් වන්නේ,
   1) නාට්‍ය අවස්ථා ඉස්මතු කිරීමට ගීත යොදා ගැනීම
   2) කතාව ගලා යාමේ දී නෙවන පාර්ශ්වයක මැදිහත් වීමෙන් සත්‍යය හෙළි වීම
   3) තමාගේ ස්වරූපය, තරාතිරම අවබෝධ වීමෙන් නිවැරදි තීරණයකට කාලගෝල එළඹීම
   4) කාලගෝලට සේවය සඳහා මිල ගෙවනු ලබන්නේ දියණිය පාවා දීමෙන් වීම

33. අභිරූපණයේ දී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,
   1) හිස් අවකාශය තුළ සියලු ම ද්‍රව්‍යයන්හි හැඩය බර ප්‍රමාණය මැවිය යුතු ය.
   2) සාමාන්‍ය තාත්ත්වික රංගනයක් සේ නිරූපණය කළ යුතු ය.
   3) චරිතය ඉස්මතු කරන රංග වස්ත්‍ර භාවිත කළ යුතු ය.
   4) චරිත ඉස්මතු කරන අංගරචනයකින් යුක්ත විය යුතු ය.

34. රූපණ ශිල්පියෙක් අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ,
   1) ඉවසීම 2) කැපවීම 3) චරිතයේ වයස 4) වෙහෙසීම

35. යොවුන් නාට්‍ය හා බැඳි කරුණක් **නොවන්නේ,**
   1) යෞවනයාගේ සිතුම් පැතුම් ප්‍රකාශ කළ හැකි වීම
   2) අන්ගාරා ගඟ ගලා බසී ප්‍රසිද්ධ යොවුන් නාට්‍යයක් වීම
   3) සමාජ ප්‍රගතියට අහිතකර වූ දෑ පිළිබඳව සිය විරෝධය මෙම නාට්‍යවලින් ප්‍රකාශ කිරීම
   4) ඍජු ලෙස තරුණ කොටස්වල අවශ්‍යතා, අත්දැකීම් කෙරෙහි අවධානය යොමු කිරීම

36. දික්තල කාලගෝල නාට්‍යයේ දැකිය හැකි නාඩගම් ලක්ෂණයක් **නොවන්නේ,**
   1) රංග කාලය කෙටි වීම 2) රිද්මයානුකූල සංවාද භාවිත කිරීම
   3) ගමන් තාල භාවිත කිරීම 4) පූර්ව රංගය යොදා ගැනීම

37. සිරිසේන විමලවීරයන්ගේ නාට්‍ය ඇතුළත් වරණය වන්නේ
   1) වැරදුණු කුරුමානම, පිටිසර කෙල්ල, උමතු විශ්වාසය
   2) රොඩී කෙල්ල, ලංකා යක්ෂනී, පිටිසර කෙල්ල
   3) පිටිසර කෙල්ල, පබාවතී, අපට පුතේ මගක් නැතේ
   4) අපට පුතේ මගක් නැතේ, ලංකා යක්ෂනී, කඩවුණු පොරොන්දුව

38. දඹදිව සේරමාන් නම් රජ කෙනෙකු ගෝනෙකුට විද මැරීම ආශ්‍රිත උපත් කතාවක් අන්තර්ගත ශාන්තිකර්මය වන්නේ,
   1) සූනියම් ශාන්තිකර්මය
   2) මහසෝන් සමයම
   3) ගම්මඩු ශාන්තිකර්මය
   4) දහ අට සන්නිය ශාන්තිකර්මය

39. එදිරිවීර සරච්චන්ද්‍රයන් නිර්මාණය කළ නාට්‍ය පමණක් ඇතුළත් වරණය වන්නේ ,
   1) මනමේ, කදා වළලු, නරි බෑනා
   2) බෙර හඬ, සිංහබාහු, මනමේ
   3) කදා වළලු, හුණුවටයේ කතාව, හරිම බඩු හයක්
   4) වෙල්ලවැහුම්, කදා වළලු, මහාසාර

40. දික්තල කාලගෝල නාට්‍යයේ "දික්තල"ගේ චරිතයට දායක වූ රංගන ශිල්පිණියක් නොවන්නේ,
   1) මැණිකේ අත්තනායක
   2) චන්ද්‍රා පතිරණ
   3) මාධනි මල්වත්ත
   4) සෝමලතා සුබසිංහ

*****

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

| 50 | S | I, II |
|---|---|---|

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II |
| நாடகமும் அரங்கியவும் | I, II |
| Drama & Theatre | I, II |

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தரப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

නාට්‍ය හා රංග කලාව (සිංහල) II

- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න

01) විකෘති නාට්‍යය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. මුල් ම නිෂ්පාදනයේ දී ප්‍රියංගනීගේ චරිතය රඟපෑ ශිල්පිනිය කවුද? (ලකුණු 02)

II. ප්‍රියංගනී උමතු වීමට බලපෑ හේතුව දක්වන්න. (ලකුණු 02)

III. මෙම නාට්‍යයෙන් නිරූපණය වන ගැටුම් අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

IV. මෙම නාට්‍යයේ පහතරට නැටුම්වල හැඩතල හා සංගීතය භාවිත කළ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු.02)

V. මෙම නාට්‍යයේ නිශේධනීය ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

VI. මෙම නාට්‍යයේ අතීතාවර්ජන යොදා ගන්නා අවස්ථාවක් ලියන්න. (ලකුණු 02)

02) (i) කොහොඹා කංකාරි උපත් කතාවේ සඳහන් රජවරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එම ශාන්තිකර්මයේ නාට්‍යමය පෙළපාලි අන්තර්ගත යක්කම් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ ඉහත නම් කරන ලද යක්කම් අතුරෙන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

03) (i). රංගපරම සංගීතය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) නාට්‍ය සංගීතය සඳහා යොදා ගත හැකි ආදේශන භාණ්ඩ හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ඔබ නාට්‍යයේ සංගීත නිර්මාණ ශිල්පියා නම් එහි දී ඔබ අවධානයට ලක් කළ යුතු කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 06)

04) (i) ජනකතා ඇසුරින් දයානන්ද ගුණවර්ධන නිර්මාණය කළ නාට්‍යය කුමක් ද ? (ලකුණු 02)

(ii) එම නාට්‍යයට අමතරව ඔහු විසින් නිර්මාණය කළ වෙනත් නාට්‍ය හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) දයානන්ද ගුණවර්ධනයන්ගේ නාට්‍යවල දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ පැහැදිලි කරන්න.
(ලකුණු 06)

05) (i) කෝලම් ගැමි නාට්‍යයේ ප්‍රධාන කොටස් කීයද? නම් කරන්න. (ලකුණු 02)

(ii) කෝලම් ගැමි නාට්‍යයේ චරිත හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) කෝලම් රංග ශෛලියේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 06)

06) (i) ක්ෂණික නිරූපණයක් යනු කුමක් ද ? (ලකුණු 02)

(ii) ක්ෂණික නිරූපණ භාවිතයට ගන්නා අවස්ථා හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) ක්ෂණික නිරූපණවල යෙදීමෙන් රූපණ ශිල්පියාට ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න.
(ලකුණු 06)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකි ය.

ප්‍රියංගනී මනෝ වෛද්‍යවරයෙක් හමු වීමෙන් පසු ඇගේ අසනීපය තරමක් පහව ගොස් ය. ඇය දැන් සිතා සිටින්නේ ඇය පාසලේ දොළහ වසරේ කියා ය. ඇගේ මිතුරන්, ගුරුතුමිය, දෙමාපියන් එක්ව ඇයව යථා තත්ත්වයට ගැනීමට වෙහෙසෙයි. ප්‍රියංගනී නර්තන විෂයෙන් උසස් පෙළ විභාගයට මුහුණ දීමට සූදානම් වේ...

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා.
(ලකුණු 04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා. (ලකුණු 04)

(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා. (ලකුණු 04)

*****